සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)**

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ධර්මය I<br>கிறிஸ்தவம் I<br>Christianity I | 43 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොද දක්වන්න.**

**1.** සාම්ප්‍රදායිකව නව ගිවිසුමේ එළිදරව්ව ග්‍රන්ථයේ කතුවරයා ලෙස හඳුන්වනු ලබන්නේ
(1) ජොහන් ය. (2) පේදුරු ය. (3) තිමෝති ය. (4) ජාකොබ් ය. (5) ජුඩ් ය.

**2.** මුහුදු මට්ටමට වඩා අඩි 675ක් පහළින් පිහිටා තිබෙන හදවතක හැඩය ඇති මුහුද වන්නේ,
(1) මළ මුහුද ය. (2) ගලීල මුහුද ය. (3) මධ්‍යධරණී මුහුද ය.
(4) රතු මුහුද ය. (5) ගල්ෆ් මුහුද ය.

**3.** දාවිත්ගේ පෙළපතෙහි අවසාන රජතුමා වන්නේ,
(1) ජොෂියා ය. (2) ජෙහෝයාකිම් ය. (3) ශෙදෙකියා ය.
(4) සාවුල් ය. (5) සලමොන් ය.

**4.** උත්පත්ති පොතේ මුල් පරිච්ඡේදයෙන් ආරම්භ වී මෝසෙස්ගේ මරණයෙන් අවසාන වන කොටස අයත්වන සම්ප්‍රදාය වන්නේ,
(1) යාවේ ය. (2) ජුදා ය. (3) එලොහිම් ය. (4) ද්විතීය නීති ය. (5) පූජක ය.

**5.** මැවීම පිළිබඳ පළමු කථාවේ 'අහස' යන වචනයේ අර්ථය වන්නේ,
(1) ග්‍රහලෝක ය. (2) ජල උල්පත් ය. (3) විශ්වය ය.
(4) ස්වර්ගය ය. (5) කඳු ය.

**6.** පාස්කු භෝජන පිළිවෙතේ දේව නියමය කඩිනමින් ඉටුකළ යුතු බව සංකේතවත් කරනුයේ,
(1) තිත්ත පලා අනුභව මගිනි.
(2) මිදි යුෂ පානය මගිනි.
(3) පාස්කු බැටළුවා අනුභවය මගිනි.
(4) නුමුහුන් පූප අනුභවය මගිනි.
(5) කාඩි දිය පානය මගිනි.

**7.** මෙසියස් වහන්සේගේ රාජ්‍යයේ බලය සහ සාමයේ කුමරුන්ගේ ආගමනය සැමරීම සඳහා දිවැසිවර සෙකරියාගේ ග්‍රන්ථයේ 9 වන පරිච්ඡේදයේ ආරාධනා කරනුයේ කෙසේ ද?
(1) ''ස්වාමීන් වහන්සේ අප සමඟය'' යනුවෙනි.
(2) ''අන්ධකාරයෙහි ඇවිද්ද සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝ ය'' යනුවෙනි.
(3) ''අපට ළදරුවෙක් උපන්නේය'' යනුවෙනි.
(4) ''වෘකයා බැටළුවා සමග වාසය කරන්නේය'' යනුවෙනි.
(5) ''සියොන් පුරඟන ප්‍රීති ප්‍රමෝද වන්න'' යනුවෙනි.

**8.** ස්වාමීන් වහන්සේගේ දුක් විඳින සේවකයා පිළිබඳව සඳහන් වන්නේ ශුද්ධ බයිබලයේ කුමන ග්‍රන්ථයේ ද?
(1) හොසියා (2) ආමොස් (3) යෙසායා (4) මලාකි (5) නාහුම්

[දෙවැනි පිටුව බලන්න.

9. සීනයි ගිවිසුම සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - සීනයි ගිවිසුම ද්විපාර්ශ්වීය ගිවිසුමකි

B - සීනයි ගිවිසුම ජීවමාන එකකි

C - සීනයි ගිවිසුම ඒකපාර්ශ්වීය ගිවිසුමකි

D - සීනයි ගිවිසුම බිඳ වැටී ඇත්තේ ජනතාවගේ වරදිනි

E - සීනයි ගිවිසුම මගින් ජනතාවගේ පාපයන්ට සමාව ලැබේ

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි.
(4) B හා D පමණි. (5) B හා E පමණි.

10. 'දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක' යන අර්ථය සහිත නම ඇති දිවැසිවරයා කවුරුන් ද?

(1) එසකියෙල් (2) හොසියා (3) ආමොස් (4) යෙසායා (5) ජෙරමියා

11. 'මෙසපොතේමියානු ප්‍රඥාව' භාවිතා කරනු ලැබුවේ,

(1) රාජ සභා සේවකයින් පුහුණු කිරීම සඳහා ය.
(2) විශ්වයේ පැලැස්ම විස්තර කිරීම සඳහා ය.
(3) පාලනයට සුදුසුකම් ලැබූ අය පුහුණු කිරීම සඳහා ය.
(4) යහපත් සදාචාර පැවැත්ම විස්තර කිරීම සඳහා ය.
(5) රාජකීය ලියකියවිලි නඩත්තු කිරීමේ කලාව ඉගැන්වීම සඳහා ය.

12. ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප දෙකක් වනුයේ,

(1) ගීත හා කවි ය.
(2) උපමා හා ගීත ය.
(3) රූපාලංකාර හා කවිය.
(4) අතිශයෝක්ති සහ උපමාලංකාර ය.
(5) ප්‍රස්තාව පිරුළු හා අතිශයෝක්ති ය.

13. ක්‍රි.පූ. 63 දී පලස්තීන දේශය තුළ ජුදෙව් ජනතාවට ආගමික නිදහස හිමිවූයේ කවුරුන් යටතේ ද?

(1) රෝමවරු (2) ග්‍රීකවරු (3) හෙරෝදිවරු
(4) පලස්තීනවරු (5) සමාරියවරු

14. එසේනිවරුන්ගේ ජීවිත පැවැත්ම පිළිබඳ පහත කරුණු සලකන්න.

A - විවාහ වීම

B - පුනර්ජීවනය පිළිබඳ විශ්වාස නොකිරීම

C - සුදු වස්ත්‍ර ඇඳීම

D - පොදුවේ වැළඳීම

E - යක්ෂයින් පිළිබඳව විශ්වාස නොකිරීම

ඉහත කරුණු අතුරෙන් එසේනිවරුන්ට විශේෂිත වූ කරුණු වනුයේ,

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි.
(4) C හා E පමණි. (5) D හා E පමණි.

15. බයිබල් සම්ප්‍රදායන්ට අනුව ශුද්ධ වූ මතෙව්තුමා තම ශුභාරංචිය සම්පාදනය කිරීමට ආභාසය ලබා ගන්නා ලද්දේ කවර ලේඛනයක් මගින් ද?

(1) ප්‍රඥා සාහිත්‍ය (2) ගීතාවලිය (3) දිවැසි ග්‍රන්ථ
(4) ජෙරමියා ග්‍රන්ථය (5) පංච පුස්තකය

16. ඉරේනේයස් වැනි සභා පියවරුන් සඳහන් කරන ආකාරයට ශුද්ධ ජොහන් ශුභාරංචිය සඳහා තොරතුරු ලබා ගෙන ඇත්තේ,

(1) හෙජෙසිපස්තුමාගෙනි. (2) පොලිකාප්තුමාගෙනි. (3) පැපියස්තුමාගෙනි.
(4) ඔරිගන්තුමාගෙනි. (5) ජෙරොම්තුමාගෙනි.

17. විද්වත් පිළිගැනීම අනුව අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත ලියන්නට ඇත්තේ,

(1) රෝමයේ දී ය. (2) ග්‍රීසියේ දී ය. (3) පලස්තීනයේ දී ය.
(4) ගලීලයේ දී ය. (5) ජෙරුසලමේ දී ය.

18. ශුද්ධ වූ පාවුලුතුමාගේ දෙවන ධර්මදූත ගමනට සහභාගී වූයේ කවුරුන් ද?

(1) බාර්ණබස් (2) ජොහාන් මාක් (3) තීතස් (4) ලූක් (5) එරස්තස්

19. පහත සඳහන් ශුද්ධ වූ පාවුලු ලිපි/සන්දේශ සලකා බලන්න.

A - 1 තෙසලෝනික
B - 2 තෙසලෝනික
C - 1 කොරින්ති
D - එපීස
E - කොලොස්සි

ඉහත ලිපි/සන්දේශ අතුරෙන් පාවුලුතුමා අතින් ම ලියැවුණු බවට සලකනු ලබන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.
(4) C හා D පමණි. (5) D හා E පමණි.

20. 'මකාරියෝයි' යන ග්‍රීක වදනෙහි ඇතුළත් අර්ථයක් වන්නේ,
(1) ශ්‍රාවකයෝ යන්න ය.
(2) අනුගාමිකයෝ යන්න ය.
(3) ශුද්ධවන්තයෝ යන්න ය.
(4) දේශකයෝ යන්න ය.
(5) භාග්‍යවන්තයෝ යන්න ය.

21. ක්‍රිස්තුන් වහන්සේ යනු ලෝකයාට දේව රාජ්‍යය ප්‍රකාශ කළ ගුරු දේවයාණන් ලෙස හඳුන්වා දෙනු ලැබුවේ කවුරුන් ද?
(1) මතෙව්තුමා (2) මාක්තුමා (3) ලූක්තුමා
(4) ජුවාම්තුමා (5) බාර්ණබස්තුමා

22. ශුද්ධ වූ මතෙව්තුමාගේ සුවිශේෂයේ 18 වන පරිච්ඡේදයේ 'බාලයන්' ලෙස හඳුන්වන්නේ කාව ද?
(1) කුඩා දරුවන්
(2) වැඩිහිටියන්
(3) ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමිකයන්
(4) බාලවැඩ කරන වැඩිහිටියන්
(5) ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය නොකරන්නන්

23. පිලාත්ගේ භාර්යාවගේ සිහිනය සඳහන් කරන සුවිශේෂකවරයා වන්නේ,
(1) මාක්තුමා ය. (2) ලූක්තුමා ය. (3) බාර්ණබස්තුමා ය.
(4) ජොහන්තුමා ය. (5) මතෙව්තුමා ය.

24. ශුද්ධ වූ පාවුලුතුමන්ගේ ඉගැන්වීම් අනුව විශ්වාසය හා බලාපොරොත්තුව අරුත්බර කරනුයේ,
(1) කරුණාවයි. (2) ප්‍රේමයයි. (3) අනුකම්පාවයි.
(4) ඉවසීමයි. (5) යාච්ඤාවයි.

25. සෙප්තුවජින්ත පිටපතෙහි දෙවියන් වහන්සේ ට 'යාවේ' ලෙස යොදා තිබූ හෙබ්‍රෙව් නාමය ග්‍රීක භාෂාවට පරිවර්තනය කර ඇත්තේ,
(1) ස්වාමීන් වහන්සේ ලෙස ය.
(2) ක්‍රිස්තුන් වහන්සේ ලෙස ය.
(3) ජේසුස් වහන්සේ ලෙස ය.
(4) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ලෙස ය.
(5) මැවුම්කාරයාණන් වහන්සේ ලෙස ය.

26. බව්තිස්මය ලැබීමට තමන් වහන්සේ වෙත පැමිණි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව ස්නාවක ජොහන් විසින් වළක්වනු ලැබීමට හේතු වූයේ,
(1) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ කිසිදු පාප කිලුටක් නොමැති වූ බැවිනි.
(2) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තමන්ගේ ඥාති සොහොයුරෙක් වූ බැවිනි.
(3) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගැලවුම්කරු බව ස්නාවක ජොහාන් දැන සිටි බැවිනි.
(4) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය මෙතෙක් ආරම්භ වී නොමැති බැවිනි.
(5) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මේ වන විටත් යක්ෂයා විසින් පරීක්ෂා කර නොමැති බැවිනි.

27. ශුද්ධ ලියවිලි විශාරදයින් දක්වන ආකාරයට, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ ඉගැන්වීමේ දී ජේසුස් වහන්සේ භාවිතා කළ යෙදුම වූයේ,
(1) පූජයයි. (2) යාගයයි. (3) මාංසයයි. (4) මන්නායි. (5) ආහාරයයි.

28. රෝමයේ ප්‍රදේශ ගණනාවක් වනසාලමින් ඇති වූ ගින්නට කිතුනුවන් වගකිව යුත්තන් කරමින්, ඔවුන්ට දරුණු ලෙස පීඩා කිරීමට කටයුතු කරන ලද්දේ,
(1) පළමුවන පීඩන යුගයේ දී ය.
(2) දෙවන පීඩන යුගයේ දී ය.
(3) තුන්වන පීඩන යුගයේ දී ය.
(4) සතරවන පීඩන යුගයේ දී ය.
(5) පස්වන පීඩන යුගයේ දී ය.

29. පළමුවරට කිතුනු පූජකවරුන්ට හා රදගුරුවරුන්ට දරුණු ලෙස පීඩා කිරීම ආරම්භ කළ අධිරාජ්‍යයා වූයේ,
(1) ඩෙසියස් ය. (2) වැලේරියන් ය. (3) අවුරේලියස් ය.
(4) මැක්සිමිනස් ය. (5) දියොක්ලේසියා ය.

30. 'පාපොච්චාරණය' (The Confession) හා 'දේව නගරය' (The City of God) යන කෘතීන් ලියා ශුද්ධ වූ සභාවට දානය කරන ලද්දේ,
(1) ශුද්ධ වූ ජස්ටින්තුමා විසිනි.
(2) ශුද්ධ වූ ජෙරෝම්තුමා විසිනි.
(3) ශුද්ධ වූ සිරිල්තුමා විසිනි.
(4) ශුද්ධ වූ අගොස්තීනුතුමා විසිනි.
(5) ශුද්ධ වූ අතනාසියුස්තුමා විසිනි.

31. ශුද්ධ වූ සභා ඉතිහාසය දෙස හැරී බලන කල පෙනී යනුයේ එයට දරුණුත ම බලපෑම් එල්ල වී ඇත්තේ,
(1) ජුදා සමාජයෙන් බවයි.
(2) සද්දුසිවරුන්ගෙන් බවයි.
(3) පරිසිවරුන්ගෙන් බවයි.
(4) සභාව තුළින් ම බවයි.
(5) රෝම අධිරාජ්‍යයෙන් බවයි.

32. ක්‍රිස්තුවේදීය මන්ත්‍රණ සභාවක් ලෙස හඳුන්වන ලද්දේ,
(1) ලියොන්ස් මන්ත්‍රණ සභාවයි.
(2) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවයි.
(3) ලැටරන් මන්ත්‍රණ සභාවයි.
(4) පළමු වතිකාන මන්ත්‍රණ සභාවයි.
(5) කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාවයි.

33. පළමු නිසියානු මන්ත්‍රණ සභාව මගින් පිළිතුරු සෙවීම සඳහා හේතු පාදක වූයේ,
(1) ඒරියන් වාද භේදයයි.
(2) අප්‍රධානතා වාද භේදයයි.
(3) එව්ටිකියන් වාද භේදයයි.
(4) පෙලාජියානු වාද භේදයයි.
(5) නෙස්ටෝරියානු වාද භේදයයි.

34. පහත ප්‍රකාශ සලකන්න.
A - වැන්ඩල් ගෝත්‍රිකයා රෝමයට පහර දීමෙන් වැලකී සිටියේ ය.
B - ක්‍රි.ව. 476 පමණ වනවිට මුළු බටහිර අධිරාජ්‍යය ම ගෝත්‍රික පාලන බලයට යටත් විය.
C - පෙලාජියානු වාදය මනුෂ්‍ය ස්වභාවය ජන්ම පාපය මගින් විනාශ වී ඇතැයි යන මතයේ ස්ථිරව සිටියේ ය.
D - පස්වන සියවස වනවිට බොහෝ අධිරාජ්‍යවාදීන් පෙරදිග සභාවේ පාලකයින් ලෙස කටයුතු කළහ.
E - තුන්වන සියවස අවසානයේ දී අධිරාජ්‍යා විසින් ශුද්ධ වූ සභාව පීඩාවට ලක් කිරීම අවසාන කර තිබුණි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A සහ C පමණි. (2) A සහ E පමණි. (3) B හා D පමණි. (4) C හා E පමණි. (5) D හා E පමණි.

35. ශුද්ධ වූ සභාව තුළ පැවති දේව ධාර්මික හා ආධ්‍යාත්මික නවෝදයේ යුගය හෙවත් සභා පියවරුන්ගේ යුගයට නැවතීමේ තිත වැටෙන්නට වූයේ,
(1) සතරවන සියවසේ දී ය.
(2) පස්වන සියවසේ දී ය.
(3) සයවන සියවසේ දී ය.
(4) සත්වන සියවසේ දී ය.
(5) අටවන සියවසේ දී ය.

**36.** කිතුනු සභාව හා ඕතොඩොක්ස් සභාව අතර ගොඩ නැගී තිබුණ ගැටුම යම් එකඟතාවයකට පත් වූයේ,
(1) ක්‍රි.ව. 590 දී පළමු ග්‍රෙගරි පාප්තුමාගේ කාලයේ දී ය.
(2) ක්‍රි.ව. 858 දී පළමු නිකලස් පාප්තුමාගේ කාලයේ දී ය.
(3) ක්‍රි.ව. 1073 දී හත්වන ග්‍රෙගරි පාප්තුමාගේ කාලයේ දී ය.
(4) ක්‍රි.ව. 1493 දී හයවන ඇලෙක්සැන්ඩර් පාප්තුමාගේ කාලයේ දී ය.
(5) ක්‍රි.ව. 1965 දී හයවන පාවුලු පාප්තුමාගේ කාලයේ දී ය.

**37.** ලොයලාහි ශුද්ධ වූ ඉග්නාසියුස්තුමන් විසින් රචනා කරන ලද ග්‍රන්ථය කුමක් ද?
(1) පූර්ණ දිවියකට මග (The Way of Perfection)
(2) ඇතුළාන්ත මන්දිරය (The Interior Castle)
(3) ආත්මයේ අඳුරු රාත්‍රිය (Dark night of the Soul)
(4) ආධ්‍යාත්මික පුහුණුව (Spiritual Exercises)
(5) ආධ්‍යාත්මික ගීතය (Spiritual Canticle)

**38.** එකොළොස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමන් විසින් ප්‍රකාශයට පත් කරන ලද විශ්ව ලේඛනයක් වනුයේ,
(1) පාචෙම් ඉන් ටෙර්රිස් (ලෝක සාමය) ය.
(2) ක්වඩ්‍රාජෙස්සිමෝ අන්නෝ (හතලිස් වසර) ය.
(3) රේරුම් නොවාරුම් (වෙහෙසන මිනිස්සු) ය.
(4) පොපුලෝරුම් ප්‍රෝග්‍රෙස්සියෝ (ජනතා ප්‍රගතිය) ය.
(5) මානේ නොබිස්කුම් දෝමිනේ (අප සමග නතර වුව මැනව) ය.

**39.** කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටස් නමැති දේශ සංචාරකයාගේ සාක්ෂිය ශ්‍රී ලාංකිකයින්ට වැදගත් වනුයේ,
(1) පෘතුගීසීන්ගේ පැමිණීම ගැන එහි සඳහන් නිසා ය.
(2) සංකිලි රජතුමාගේ පීඩන පිළිබඳව එහි සඳහන් නිසා ය.
(3) කිතු දහම වැළඳ ගත් ධර්මපාල කුමරු ගැන එහි සඳහන් නිසා ය.
(4) පොළොන්නරු යුගයේ සිටි කතෝලිකයින් ගැන එහි සඳහන් නිසා ය.
(5) සයවන සියවසේ දී ශ්‍රී ලංකාවේ ක්‍රිස්තු භක්තිකයින් සිටි බවට සඳහන් වන නිසා ය.

**40.** පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු ප්‍රථම දිව්‍ය පූජාව පවත්වන ලද්දේ,
(1) ගරු විසෙන්ති පියතුමා විසිනි.
(2) ගරු ගොන්සාලෝ පියතුමා විසිනි.
(3) ගරු සීමන් ද කොයිම්බ්‍රා පියතුමා විසිනි.
(4) ගරු අන්තෝනියෝ පද්‍රාම් පියතුමා විසිනි.
(5) ගරු ජුවන් ද විලා ද කොන්දේ පියතුමා විසිනි.

**41.** දහසය වන සියවසේ දී ඉන්දියාවේ ගිනිකොන දිග මුහුදුකරයේ විසූ පරවර හා කරෙයියාර් වැනි කුලවල ජනයා කිතු දහම පිළිබඳව පැහැදී බව්තීස්මය ලබාගත් බව ඇසූ මන්නාරම් දූපතේ කරෙයියාර්වරු තමන්ට ද දහම් දෙසන ලෙස ආරාධනා කරන ලද්දේ,
(1) ගරු ගොන්සල්වෙස් පියතුමාට ය.
(2) ගරු ප්‍රැන්සිස් සාවියර් පියතුමාට ය.
(3) ගරු ජුසේ වාස් පියතුමාට ය.
(4) ගරු ජෝන් ස්ටීවන් සෙමෙරියා හිමිපාණන්ට ය.
(5) ගරු ජෝශප් මේරි බ්‍රාවි පියතුමාට ය

**42.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
A - අධ්‍යාපන කටයුතු සංවිධානය බිඳ වැටුණි
B - කතෝලික වත් පිළිවෙත් සඳහා අවසර ලැබිණි
C - කිතුනු දරුවනට යාච්ඤා ඉගැන්වීම අතපසු විය
D - කිතුනුවන් තම ගෙලෙහි ජපමාලය පැළඳගෙන සිටියහ
E - 16 වන සියවසේ දී ඕලන්දය රෙපරමාදු දහමට යොමු විය
F - අඥාන ඖෂධය හා ක්‍රිස්තියානි පල්ලිය යන පොත් එළි දක්වන ලදි
ඉහත ප්‍රකාශ අතුරෙන් ලන්දේසි යුගයට අදාළ ප්‍රකාශ වනුයේ,
(1) A, B සහ C පමණි. (2) A, E සහ F පමණි. (3) B, C සහ D පමණි.
(4) C, D සහ E පමණි. (5) D, E සහ F පමණි.

**43.** ලන්දේසින් ශ්‍රී ලාංකික කතෝලිකයන්ට පීඩා කිරීමට එක් හේතුවක් වූයේ,
(1) කිතුනු ආගමික කටයුතු සඳහා දේශීය භාෂා යොදා ගැනීමයි.
(2) ශ්‍රී ලංකාවේ කුරුඳු ඒකාධිකාරය කතෝලිකයන් අතර පැවතීමයි.
(3) පෘතුගීසින් කතෝලික ආගම මුවාවෙන් මෙරට බෞද්ධයින්ට හිරිහැර කිරීමයි.
(4) මහනුවර රාජධානියේ වසූරිය වසංගතයට ගොදුරුවූවන්ට කිතුනුවන් උපකාර කිරීමයි.
(5) කතෝලික දහම මෙරට කතෝලිකයින් හා පෘතුගීසින් අතර ප්‍රබල පුරුකක් වනු ඇතැයි සිතීමයි.

**44.** දහඅට වන සියවසේ දී ශ්‍රී ලංකාව තුළ ආගමික කටයුතු නිදහසේ කරගෙන යාමට කතෝලික පියවරුන්ට අවසර ලැබුනේ,
(1) විලියම් ග්ලැඩ්වින් ගෙනි.
(2) ඈඩම් වෙස්ටර් වෝල්ට් ගෙනි.
(3) දොන් අපොන්සු පෙරෙයිරා ගෙනි.
(4) ස්කොලාකල් කොමිසම මගිනි.
(5) ජේම්ස් ස්ටුවර්ට් ගෙනි.

**45.** ශුද්ධ වූ බයිබලය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමට මග පෙන්වීම ලැබුණේ,
(1) විලියම් ටොල්ෆ්‍රී ගෙනි.
(2) ප්‍රැන්සිස්කෝ ද අල්මේදා ගෙනි.
(3) වික්ටර් ලොපානෝ ගෙනි.
(4) කොන්ස්තන්තීනු කුමරු ගෙනි.
(5) ජෝන් ද විලා ද කොන්දේ පියතුමා ගෙනි.

**46.** ශ්‍රී ලංකාවේ විජාතික ආණ්ඩුකාරවරයාට විරුද්ධව පිළියෙළ කරන ලද පෙත්සම තම පාවහනේ සඟවා ගෙන බ්‍රිතාන්‍යයට ගෙන යන ලද්දේ,
(1) ජේ.ඒ.එල්. කුරේ විසිනි.
(2) ශ්‍රීමත් ජේම්ස් පීරිස් විසිනි.
(3) ඊ.ඩබ්. පෙරේරා විසිනි.
(4) ඇල්බට් ඒ. වික්‍රමසිංහ විසිනි.
(5) ක්‍රිස්ටෝෆර් බොන්ජන් පියතුමා විසිනි.

**47.** නිදහසෙන් පසු ශ්‍රී ලංකා කතෝලික සභාව මුහුණ දුන් ගැටලුවක් වනුයේ,
(1) ධර්ම ප්‍රචාරක කටයුතු තහනම් කර තිබීමයි.
(2) දිව්‍ය පූජාව ලතින් භාෂාවෙන් පැවැත්වීමට සිදුවීමයි.
(3) ක්‍රිස්තියානි ආගමිකයින් කෙරෙහි නිර්දය විවේචන සිදු කිරීමයි.
(4) ආගමික කටයුතු හා උත්සව සඳහා සීමා පමුණුවා තිබීමයි.
(5) ආගමික කටයුතු සඳහා විදේශීය මුදල් ආධාර නොලැබීමයි.

**48.** කතෝලික පාසල්වල සිසු සිසුවියන්ට ආගමික අධ්‍යාපනය අහිමි වීමට සහ බොහෝ පාසල්වල කතෝලික විදුහල්පතිවරුන් නොමැති වීමට මූලික හේතුව වූයේ,
(1) කිතුනු ආගමික ව්‍යාපාර බෙදී යාම ය.
(2) 1960 දී ආගමික පාසල් රජයට පවරා ගැනීම ය.
(3) 1867 දී ඉදිරිපත් වූ ආගමික උපකෘත පාඨශාලා ක්‍රමය ය.
(4) 1970 දශකය අග භාගයේ හටගත් ජනවාර්ගික ගැටුම ය.
(5) ඇතැම් පෘතුගීසි සොල්දාදුවන්ගේ කෲර ක්‍රියාවල වරද කතෝලිකයින් වෙත පැටවීම ය.

**49.** මිනිසාට පමණක් හිමි භාග්‍යය කුමක් ද?
(1) සවන් දීමේ හැකියාව
(2) විවිධ ප්‍රදේශ අතර සංක්‍රමණය වීමේ හැකියාව
(3) නිදහස් තීරණ ගැනීමේ හැකියාව
(4) පවුල් දිවියක් ගත කිරීමේ හැකියාව
(5) තම වර්ගයා නොකඩවා පවත්වා ගෙන යාමේ හැකියාව

**50.** ශුද්ධ වූ සභාවේ අනිවාර්යය ලක්ෂණයක් වන්නේ,
(1) ජන වන්දනාවයි.
(2) අපෝස්තලිකත්වයයි.
(3) දේවමාතා භක්තියයි.
(4) දේවස්ථාන මංගල්‍යයයි.
(5) දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයයි.

***

Department of Examinations

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

| | | | |
|---|---|---|---|
| **ක්‍රිස්තියානි ධර්මය** | **II** | | |
| கிறிஸ்தவம் | **II** | **43** | **S** | **II** |
| Christianity | **II** | | |

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| **අමතර කියවීම් කාලය** | - | **මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) ශුද්ධ බයිබලයේ ග්‍රීක පිටපත හා ලතින් පිටපත හඳුන්වන නම් වෙන වෙන ම ලියන්න. (ලකුණු 02යි)

 (ii) මළ මුහුදේ ස්වභාවය පිළිබඳ කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

 (iii) 'තියෝ', 'නෙවමා', 'තියෝනෙව්ටෝස්' යන ග්‍රීක වචන **තුනේ** අර්ථ ලියන්න. (ලකුණු 06යි)

 (iv) ශුද්ධ බයිබලය පරිහරණය තුළින් තරුණ අපේ ජීවිත මඟ සාර්ථක කර ගත හැකි ආකාර **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08යි)

2. (i) නික්මයාම පොතේ සඳහන් වසංගත 10 අතුරෙන් 9 වන සහ 10 වන වසංගත නම් කරන්න. (ලකුණු 02යි)

 (ii) 'මස්සා' සහ 'මෙරිබා' යන හෙබ්‍රෙව් වදන්වල අරුත් ලියන්න. (ලකුණු 04යි)

 (iii) ප්‍රධාන දිවැසිවරු **තිදෙනා** නම් කරන්න. (ලකුණු 06යි)

 (iv) මෙහෙ ලොවට පිබිදෙන ඔබ දිවැසිවර ආදර්ශයන් ක්‍රියාවට නන්වන ආකාරය කරුණු **හතරකින්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

3. (i) ජේවාචාරි උපස්ථායක පිලිප්තුමා විසින් දේව රාජ්‍යයේ වර්ධනය සඳහා ඉටු කරන ලද කාර්යයන් **දෙකක්** ලියන්න. (ලකුණු 02යි)

 (ii) ස්වාමින් වහන්සේ අදහා ගන්නා විජාතිකයින් සම්බන්ධයෙන් ජෙරුසලෙම් මන්ත්‍රණ සභාවේ දී ගත් නිගමන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

 (iii) පෙන්තකොස්ත දිනයේ ශුද්ධාත්මාගමනයෙන් පසු ශුද්ධ වූ පේදුරුතුමා පැවත් වූ දේශනයෙහි අඩංගු කරුණු **තුනක්** දක්වන්න. (ලකුණු 06යි)

 (iv) ශුද්ධ වූ පේදුරුතුමාගේ නායකත්ව ලක්ෂණ තුළින් වර්තමාන සමාජයේ නායකයින්ට උගත හැකි ආදර්ශ **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

## II කොටස

4. (i) සමදර්ශක ශුභාරංචි **දෙකක්** නම් කර සමදර්ශක ශුභාරංචි හා ජොහන් ශුභාරංචි අතර සමානතා **හතරක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

 (ii) ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතාදර්ශය අනුගමනය කරමින් ශුභාරංචි දේශනා කරන්නකු තුළ තිබිය යුතු ගුණාංග **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

5. (i) ජෙරුසලම මන්ත්‍රණ සභාවේ ක්‍රමවේදය කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ශුද්ධ වූ පාවුලුතුමාගේ ජීවිතයෙන් කිතුනුවාට ලබා ගත හැකි ආදර්ශ **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

6. (i) ශුද්ධ වූ පාවුලුතුමා ක්‍රිස්තුන් වහන්සේගේ බැහැපත්වීම පිළිබඳ පිලිප්පි සංඝයට ඉදිරිපත් කළ ඉගැන්වීම **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) බැහැපත්කම නැමති ගුණාංගය, අභියෝගාත්මක වත්මන් සමාජය තුළ ඔබ ක්‍රියාවට නංවන අවස්ථා **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

7. (i) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ අතනාසියස්තුමාගේ ජීවිතය පිළිබඳ කෙටි හැඳින්වීමක් කර, එතුමාගෙන් කතෝලික සභාවට ලැබුණු දායකත්වය කරුණු **තුනකින්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) දේව රාජ්‍යයේ වර්ධනය සඳහා ඔබ ප්‍රදේශයේ වැඩිහිටි ප්‍රජාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් ඔබට දායක විය හැකි ආකාර **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

8. (i) බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය කරුණු **පහකින්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා ලක් සසුනේ උන්නතිය වෙනුවෙන් කළ සේවාවන් **පහක්** සඳහන් කර, ඒවා ආදර්ශයට ගනිමින් ලක් සසුන වෙනුවෙන් ඔබට කළ හැකි ක්‍රියා **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

* * *

PAST PAPERS WIKI



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න